## චතාරික සමයේ තුන්වන ඉරුදින- 2014-03-23

**තේමාව** : 'නොසිඳෙන උල්පතක් සේ සමිඳාණෝ අප හදවත් තුල නිරතුරු ලැගුම් ගන්නා සේක¶

**හැඳින්වීම**

ප්‍රසාද ස්නාපන පිළිවෙතේදී පවිත්‍රතාවේ සංකේතයක් ලෙස ජලය භාවිතා කරයි. පාපයේ ජීවිතයෙන් මැරී නව ජීවිතයකට ඇතුළුවීම එමගින් අරුත් ගන්වයි. අද සුපුවත තුල සමිඳු වදන ප්‍රකාශ කරන්නේ යලිත් පිපාස නොවන ජීවනදායක ජලයක් පිළිබඳවයි. එනම් ස්වාමීන්වහන්සේ තුලින් ලබාගන්නා වූ ජලය, යමෙක් තුල නොසිඳෙන දිය උල්පතක් සේ සදා පවතින බවයි. ක්‍රිස්තුස් වහන්සේ ලබාදෙන ජීවිතය වන්නේ දෙවිඳුන්ගේ ආදරයයි. එම දෙවිඳු ආදරය ජීවන දායක දීමනා තුලින් අපට අයිති කර දෙන්නට කිතු සමිඳාණන් තම ජීවිතය පූජා කල සේක. එසේනම් අපත් එම දීමනා වලින් පිරෙන්නට අවැසි වරම් මෙම දිව යාගය තුලින් ඉල්ලා සිටිමු.

**ඇතුලුවීමේ ගීය** : කි. බැ.ගී. අංක 56- තේජස මහිමය

**පළමු කියවීම** : නික්මයාම 17 : 3-7

එදිනෙදා ජීවිතයේදී අපට බාධක පැමිණියත්, අපව ආරක්ෂා කරමින්, අපට අවශ්‍ය දේ ලබා දෙන දෙව්පියාණන් කෙරෙහි අපගේ විශ්වාසය නොසැලී තබාගත යුතු බව පළමු කියවීම තුලින් අවධාරණය කරයි.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගිය ගායනා කරන්න.

**දෙවන කියවීම** : රෝම 5 : 5-8

වරප්‍රසාදයට පිවිසෙන මග කිතු තුමා ලබාදුන් බවත්, දෙව්පියාණන් අපට දැක්වූ ප්‍රේමයත්, අපට හිමිවන්නට තිබෙන දේව මහිමයේ බලාපොරොත්තුවේ ප්‍රිතිය පිළිබඳව දෙවිඳුන් හා අප අතර ඇති සබඳතාවය ශු.පාවුළුතුමා මෙම කියවීමෙන් අනාවරණය කරයි.

**සාදුකාරය** : දුවන ලෙසට පවසෙ පෙළී පෙළී....

ස්වාමීන් ඔබවහන්සේ සැබැවින්ම ලෝකයේ ගැලවුම්කාරයාණෝය. කිසි දිනක පිපාස නොවන පිණිස මට ජීවන දායක ජලය දුන මැනව.

**ශු. සුවිශේෂය** : ජුවාම් 4 : 5-42 හෝ 4 : 5-15, 19-26, 39-42

**විශ්වාසකයින්ගේ යැදුම් පිළිතුර** : ස්වාමිනී අපි ඔබට කරන යාච්ඥා අසා වදාල මැනව.

1. ආදර දෙව්පියාණනී, නව ජීවනය හා සැබෑ ප්‍රේමය හා කුරුසියේ ගමන් මග තුලින් ගැලවීමේ මගට පිවිසෙන්නට නව සාන්ත සභාව අප හැම ශක්තිමත් කරන පිණිස,

2. ආදර දෙව්පියාණනී, දිනේ දින අඳුරට ඇදී යන්නාවූ අප ලක් දේශය ආසිරි ගන්වා අප රට පාලකයන් ජනතාවගේ අවැසිතා තේරුම් ගනිමින් ආර්ථික හා සමාජීය පරිහානියෙන් අප රට මුදා ගන්නට අවැසි මග පෙන්වීම ඔවුනට ලැබෙන පිණිස,

3. ආදර දෙව්පියාණනී, බලාපොරොත්තු කඩ වීමෙන් දුර්වල වී සිටින ජනතාවට ජීවිතයේ උල්පත වන කිතු සමිඳුන් හඳුනා ගැනීමටත්, එතුමන් අනුව ගමන් කරමින් සදාතන ජීවිතය ලබා ගැනීමේ බලාපොරොත්තුව අප හදවත් තුල ඇති වන පිණිස,

4. ආදර දෙව්පියාණනී, අප ග්‍රාමයේ පවුල් අතර සමගිය ඇති වී සහෝදරත්වයෙන් එක්වී සැමගේ සුභ සිද්ධිය සඳහා කැපවී ක්‍රියා කිරීමටත්, සදාතන ජීවිතයේ සමිඳාණන් ලොවට හඳුන්වා දීමටත් හැකිවන පිණිස,

**පඬුරු පිදීමේ ගීය** : කි.බැ.ගී. අංක 144- ආදර දෙව් පියේ

**බොජුන් ගීය** : කි.බැ.ගී. අංක 244- සමරියානු

**අවසාන ගීය** : කි.බැ.ගී. අංක 345- මරිතුමි සමගිනා

# චතාරික සමයේ තෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය නික්මයාම 17: 3–7

*නික්මයාම පොතෙන් උපටා ගත් කොටසකි.*

"අපට බීමට ජලය ලබා දෙන්න."

සෙනඟ ද පිපාසයෙන් පෙළෙමින් මෝසෙස්ට විරුද්ධ ව කොඳුර කොඳුරා, "ඔබ අප මිසරයෙන් පිටතට ගෙනාවේ මන් ද? අප ද අපේ දරුවන් ද අපේ ගවමහිෂයන් ද පිපාසයෙන් මරාදමන්නට දැ"යි විචාළහ. මෝසෙස් එවිට සමිඳාණන් වහන්සේට මොරගසමින්, "මේ සෙනඟට මා කුමක් කරන්න ද? ඔව්හු මට ගල් ගසන්නට සැරසෙති"යි කීවේ ය. එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා, "ඔබ ඉශ්රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් සමහරෙකු ද කැටුව සෙනඟට ඉදිරියෙන් යන්න. තවද, ඔබ ගංගාවේ දියට පහර දුන් සැරයටිය ද ඔබ අත රැගෙන යා යුතු ය. බලන්න, මම ද හොරෙබ්හි පර්වතය මත ඔබ ඉදිරිපිට සිටිමි. ඔබ පර්වතයට ගැසිය යුතු ය. එවිට සෙනඟට බීමට ජලය එයින් ගලා එනු ඇතැ"යි වදාළ සේක.

මෝසෙස් ඉශ්රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් බලාගෙන සිටිය දී එලෙස කෙළේ ය. ඉශ්රායෙල් ජනයා අවලාද කී නිසාත්, 'සමිඳාණන් වහන්සේ අප අතර ඇද් ද? නැද් ද?' කියමින් ඔවුන් උන් වහන්සේ පරීක්ෂා කළ නිසාත් ඒ ස්ථානයට ඔහු මස්සා සහ මෙරිබා කියා නම් කළේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 95: 1–2, 6–9

**පිළිතුර** : එතුමාණන් පවසන දේට සවන් දෙන්න.

**ගීය** : එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු:
අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු.
තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු:
එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු:
අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු.
එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමන්ගේ සෙනග ය:
එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය.
එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!

“පාළුකරයේ මස්සා නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද
මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩි කර නොගන්න.
එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය.
මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ ය.”

## දෙවන දේව ප්‍රකාශනය රෝම 5: 1–2, 5–8

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ
දේව ප්‍රේමයෙන් අප සිත් පුරවන සේක.

අප ඇදහිල්ලෙන් දමිටු බවට පමුණුවනු ලැබූ බැවින් අපේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ හා සමඟ අපට සාමදානය ඇත. තවද ඇදහිල්ලෙන් අපට ලැබී ඇති මේ දේව වරප්‍රසාදයට පිවිසෙන මඟ අපට සලසා දුන්නේ උන් වහන්සේ ය. ඒ නිසා අපට හිමි වන්නට යන දේව මහිමයේ බලාපොරොත්තු ගැන අපි අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමු. එබඳු

බලාපොරොත්තුවකින් කිසි ම කලකිරීමක් ඇති නොවෙයි. මන්ද, අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක.

අප අනාථ ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ පව්කාරයන් උදෙසා නියමිත කාලයේ දී සිය දිවි පිදූ සේක. සත් ගුණවත් කෙනෙකු උදෙසා දිවි පිදීමට යමෙකු තුළ ධෛර්යය තිබුණත් එවැන්නකු උදෙසා දිවි පිදීමක් සිදුවන්නේ කලාතුරකිනි. අප උදෙසා ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ වන්නේ අප පව්කාරයන් ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — ජොහන් 4: 42, 15

ස්වාමිනි, ඔබවහන්සේ සැබැවින්ම
ලෝකයේ ගැළැවුම්කාරයාණෝ ය.
මට තවත් පිපාසය ඇති නො වන පිණිස,
මට ජීවනදායක ජලය දුන මැනව.

## සුවිශේෂය — ජොහන් 4: 5–42
හෝ 4: 5–15, 19–26, 39–42

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### මා දෙන වතුර සදාතන ජීවනය දෙන දිය උල්පතක් වන්නේ ය.

ජේසුස් වහන්සේ, ජාකොබ් තම පුත් ජොසෙප්ට දුන් ඉඩම ළඟ වූ සිකාර් නම් සමාරියේ නගරයකට පැමිණි සේක. ජාකොබ්ගේ ළිඳ එහි විය. ගමන් විඩාවෙන් සිටි උන් වහන්සේ ළිඳ ළඟ හිඳගත් සේක. එය මධ්‍යහ්න වේලාව පමණ විය.

එකල, සමාරිය ස්ත්‍රියක් වතුර අදිනු පිණිස පැමිණියා ය. “මට වතුර ටිකක් දෙන්නැ”යි උන් වහන්සේ ඇයට වදාළ සේක. එවේලේ, උන් වහන්සේගේ ශ්‍රාවකයෝ කෑම මිලයට ගනු පිණිස, නගරයට ගොස් සිටියෝ ය. සමාරිය ස්ත්‍රිය ද, “ජුදෙව්වෙකු වන ඔබ, සමාරිය ස්ත්‍රියක වන මගෙන් බොන්නට ඉල්ලන්නේ,

කෙසේ දැ''යි උන් වහන්සේගෙන් ඇසුවා ය. එසේ කීවේ, ජුදෙව්වරුන් හා සමාරියයන් අතර ගනුදෙනුවක් නුවූ බැවිනි. ජේසුස් වහන්සේ ඇයට පිළිතුරු දෙමින්, ''දෙවියන් වහන්සේගේ දීමනාවත්, 'මට වතුර ටිකක් දෙන්නැ' යි ඔබට කියන්නේ කවරෙක් ද කියාත් ඔබ දැන සිටියෙහි නම්, ඔබ ඔහුගෙන් ඉල්ලනු ඇත: එවිට ඔහු ජීවන ජලය ඔබට දෙනු ඇතැ''යි වදාළ සේක.

ස්ත්‍රිය ද, ''මහතාණෙනි, වතුර අදින්නට ඔබට භාජනයක් නැත: ළිඳත් ගැඹුරු ය: එබැවින් ඒ ජීවන ජලය ඔබට කොයින් ද? මේ ළිඳ අපට දුන්නේ අපේ පියා වන ජාකොබ් ය. ඔහු ද, ඔහුගේ පුත්‍රයෝ ද ගවයෝ ද මෙයින් පානය කළෝ ය. ඔබ ඔහුට වඩා උතුම් දැ?''යි විචාළා ය.

ජේසුස් වහන්සේ ඇයට පිළිතුරු දෙමින්, ''මේ වතුර බොන හැම කෙනෙකුට ම නැවත පිපාසය ඇති වන්නේ ය. එහෙත් මා දෙන වතුර බොන කවර කෙනෙකුට වුවත් කිසි කලෙක පිපාසය ඇති නොවන්නේ ය. මා ඔහුට දෙන වතුර සදාතන ජීවනය පිණිස ඔහු තුළ දිය උල්පතක් වන්නේ ය''යි වදාළ සේක. ස්ත්‍රිය කතා කරමින්, ''මහතාණෙනි, මට නවත් පිපාසය ඇති නො වන පිණිසත්, වතුර ඇදීමට මෙපමණ දුර නැවත නොඑන පිණිසත් ඒ වතුර මට දුන මැනවැ''යි කීවා ය.

(ජේසුස් වහන්සේ ඈ අමතා, ''යන්න, ඔබේ ස්වාමි පුරුෂයා කැඳවාගෙන මෙහි එන්නැ''යි වදාළ සේක. ස්ත්‍රිය පිළිතුරු දෙමින්, ''මට ස්වාමි පුරුෂයෙක් නැතැ''යි කීවා ය. ජේසුස් වහන්සේ ද, '' 'මට ස්වාමි පුරුෂයෙක් නැතැ' යි ඔබ කීවා හරි ය: මන්ද, ඔබට පුරුෂයෝ පස් දෙනෙක් සිටියාහ: දැන් සිටින තැනැත්තේ ඔබේ පුරුෂයා නො වේ: මේ දේ ඔබ සැබෑ ලෙස පැවසුවෙහි ය''යි වදාළ සේක.)

ස්ත්‍රිය උන් වහන්සේ අමතමින්, ''මහතාණෙනි, ඔබ දිවැසිවරයකු බව මට පෙනේ: අපේ පියවරු මේ කන්ද මත නමස්කාර කළහ. එහෙත්, මිනිසුන් නමස්කාර කළ යුතු ජෙරුසලමෙහි ය යි ඔබතුමන්ලා කියන්නහු ය''යි කීවා ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, ''ස්ත්‍රිය, මා විශ්වාස කරන්න. මේ කන්දේ දී වත්, ජෙරුසලමේ දී වත් ඔබ පියාණන් වහන්සේට නමස්කාර නොකරන කාලයක් පැමිණෙන්නේ ය. ඔබ නමස්කාර කරන්නේ ඔබ හරියට ම නො දන්නා කෙනෙකුට ය: අප නමස්කාර කරන්නේ අප දන්නා කෙනෙකුට ය. මන්ද, ගැළවීම පැමිණෙන්නේ ජුදෙව්වරුන්

ගෙන් ය. එහෙත්, නමස්කාර කරන්නන්, ආත්මානුභාවයෙන් ද අවංක සිතින් ද, පියාණන් වහන්සේට නමස්කාර කරන කාලයක් සැබැවින් ම පැමිණෙන්නේ ය: දැනටමත් පැමිණ ඇත. තමන් වහන්සේට නමදින පිණිස පියාණන් වහන්සේ සොයන්නේ එවැන්නන් ය.

දෙවියන් වහන්සේ ආත්මය ය: උන් වහන්සේට නමස්කාර කරන්නන් ආත්මයෙන් ද අවංක සිතින් ද නමස්කාර කළ යුතු ය"යි වදාළ සේක.

ස්ත්‍රිය පිළිතුරු දෙමින්: " 'ක්‍රිස්තුස් වහන්සේ' ය යි කියන මෙසියස් තුමාණන් එන බව දනිමි: උන් වහන්සේ පැමිණි කල සියල්ල අපට දන්වා වදාරන සේකැ"යි කීවා ය. "මේ ඔබ සමඟ කතා කරන මම, ඒ තැනැත්තා වෙමි"යි ජේසුස් වහන්සේ වදාළ සේක.

(ඒ මොහොතේ දී, පැමිණි උන් වහන්සේගේ ශ්‍රාවකයෝ උන් වහන්සේ ස්ත්‍රියක සමඟ කතා කරනු දැක මවිත වූහ. එහෙත් කිසිවෙක් "ඔබ කුමක් සොයන්නෙහි ද" කියාවත්, "ඔබ ඇ සමඟ කතා කරන්නේ මන් ද?" කියාවත් ඇසුවේ නැත. ස්ත්‍රිය ඇගේ වතුර කළය එතැන තබා, නුවරට ගොස්, "එන්න ඇවිත් බලන්න, මා කළ සියල්ල මට කී මනුෂ්‍යයෙක් සිටියි. එතුමා ක්‍රිස්තුස් විය නොහැකි දැ"යි සෙනගට කීවා ය. ඔව්හු නුවරින් නික්ම ජේසුස් වහන්සේ වෙත එන්නට පටන් ගත්හ.

ඒ අතර ශ්‍රාවකයෝ, "ගුරුදේවයෙනි, වළඳනු මැනවැ"යි උන් වහන්සේගෙන් අයැද සිටියෝ ය. එහෙත් උන් වහන්සේ, "ඔබ නොදන්නා භෝජනයක් වැළඳීමට මට ඇතැ"යි ඔවුන්ට වදාළ සේක. "යම් කිසිවෙක් උන් වහන්සේට ආහාර ගෙනවුත් දුන්නේ දැ"යි එවිට ශ්‍රාවකයෝ තම තමන් අතරේ විමසූ හ.

ජේසුස් වහන්සේ ඔවුන් අමතා, "මාගේ භෝජනය නම්, මා එවූ තැනැත් වහන්සේගේ කැමැත්ත කිරීමත්, උන් වහන්සේගේ කාර්යය නිමාවට පත් කිරීමත් ය.

තව හාරමාසයක් ගත වූ විට අස්වැන්න පැමිණේ යයි ඔබ කියන්නේ නැද් ද? එහෙත් මම ඔබට කියමි: බලන්න, ඔබේ ඇස් ඇර කුඹුරු නරඹන්න: මන් ද? ඒවා දැනට ම අස්වැන්න සඳහා පැසී ඇත. ගොයම් කපන්නා කුලිය ලබා, සදාතන

ජීවනය සඳහා අස්වැන්න එකතු කරයි: එසේ වන්නේ, වපුරන්නාත්, කපන්නාත් එක්ව ප්‍රීතිමත් වන පිණිස ය. මෙයින්, 'එක් කෙනෙක් වපුරයි. තව කෙනෙක් කපයි' යන කීම සැබෑ වෙයි.

ඔබ වගා නො කළ කෙතක අස්වැන්න කැපීමට මම ඔබ යැවීමි. අන්‍යයෝ වගා කළහ. ඔබ ඔවුන්ගේ වගාවේ ප්‍රතිඵල භුක්ති විඳින්නහු ය"යි වදාළ සේක.)

"මා කළ සියල්ල උන් වහන්සේ මට වදාළ සේකැ"යි සාක්ෂි දුන් ස්ත්‍රියගේ කීම නිසා, ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන් වහන්සේ අදහාගත්හ. එබැවින් සමාරියයෝ උන් වහන්සේ වෙතට පැමිණි කළ, තමන් සමඟ නවතින ලෙස උන් වහන්සේගෙන් ඉල්ලූ හ. උන් වහන්සේ ද දෙදවසක් එහි නැවතුණ සේක.

තවද බොහෝ දෙනෙක් උන් වහන්සේගේ ම වචනය නිසා අදහා ගත්තෝ ය.

ඔව්හු ස්ත්‍රියට කතා කොට, "දැන් අප අදහන්නේ ඔබේ කීම නිසා නො වේ: අප ම උන් වහන්සේගේ බස් අසා, උන් වහන්සේ සැබැවින් ම ලෝකයේ ගැළවුම්කාරයාණන් බව දැනගත් නිසා ය"යි කී හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*(වරහන් අතර කොටස් අත් හළ හැකිය.)*



## “මට තවත් පිපාසය ඇති නොවන පිණිස ඒ වතුර මට දුන මැනව.”

*චතාරික සමයේ තෙවන ඉරුදින - 19-03-2017*

### හැඳින්වීම

චතාරික සමයේ තුන්වන ඉරිදාවත් එළඹී ඇත. අවුරුද්දේ වෙන කාල වලට වඩා මේ දවස් වල දී ඔබේ දින චර්යාවේ වෙනසක් සිදුවී තිබෙනවාද? නැත්නම් හැමදාමත් වගේ ඔබ කෙළවරක් නැති වැඩ සහ ප්‍රශ්න අතර සිරවෙලාද? මොනවද ඔබ හොයන්නෙ? සතුට ද? ආදරය ද? ජීවත් වෙන්න විදිහක් ද? මොනවා ලැබුණොත් ද ඔබ තෘප්තියට පත්වෙන්නෙ? ඔබේ පිපාසය නැවතත් ඇති නොවන ආකාරයකින් නිවා දැමීමට මගක් ඇති බව අද ක්‍රිස්තුන් වහන්සේ පවසන සේක. සමරිතානු ස්ත්‍රීයට පොරොන්දු වූ ජීවන ජලය ඔබටත් දීමට උන්වහන්සේ කැමැත්තෙන් සිටින සේක. උන්වහන්සේ ලබා දෙන ජීවන ජලය ලබා ගැනීමට ඔබේ දෑත විවෘත කරනවාද? නැත්නම් තදින් මිට මොලවාගෙන මෙතුවක් කල් දිවූ දිවිල්ල දිගට ම දුවනවාද?

### දේව වචනය

දෙවියන් වහන්සේ, පීඩාවට පත්ව සිටි ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවෙන් මුදාගත්තේ බොහෝ විශ්මය ජනක ක්‍රියා සිදුකරමිනි. එහෙත් පොරොන්දු දේශය කරා යන ගමනේ දී මුහුණ දෙන්නට සිදුවූ දුෂ්කරතා වල දී ඊශ්‍රායෙල්වරුන්ට දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා සහ ආදරය අමතක විය. ඔවුහු කිහිප වතාවක් ම දෙවියන් වහන්සේට විරුද්ධව කැරලි ගැසූහ. අද පළමු කියවීමට පාදක වන්නේ එවැනි එක් සිද්ධියකි. ජලය හිඟ වීම නිසා ඊශ්‍රායෙල්වරු කෝප වී තර්ජනාත්මක ලෙස මැසිවිලි කියූහ. නැවත වරක් දෙවියන් වහන්සේ ඔවුන් ඉදිරියේ ප්‍රාතිහාර්යයක් සිදු කරමින් පර්වතයකින් ජලය ගලා යන්නට සැලසූ සේක. මෙම කියවීම අද සුවිශේෂයට හොඳ ප්‍රවේශයක් ලබා දෙයි.

**නික්මයාම 17:1-7**

**ගීතාවලිය 95:1-2, 6-9**

**රෝම 5:1-2, 5-8**

**ශු. ජුවාම් 4:5-42**

ක්‍රිස්තුන් වහන්සේ සමරිතානු ස්ත්‍රීයකට ජීවන ජලය දීමට පොරොන්දුවන සංවාදය අද සුවිශේෂයෙන් විස්තර වේ. මේ සතියේ සිට චතාරික කාලයේ ඉදිරි සති සඳහා, අපි සාමාන්‍යයෙන් පළමු වසරේ දී යොදා ගන්නා මතෙව් තුමාගේ සුවිශේෂයෙන් ඉවත් වී ජුවාම් සුවිශේෂය දෙසට හැරෙමු. අද අප සවන් දෙන සංවාදයේ වැදගත් කරුණු කීපයක් ඇත: ගැළවීම රැගෙන එන්නේ ක්‍රිස්තුන් වහන්සේ ය, උන්වහන්සේ මනුෂ්‍යයාගේ පාපය අනාවරණය කරන සේක, ආත්මයාණන්ගෙන් ද සත්‍යයෙන් ද කරන සැබෑ නමස්කාරය ආරම්භ කරන්නේ උන්වහන්සේ ය.



පාවුලු තුමා රෝමවරුන්ට යැවූ ලිපියේ අද දෙවන කියවීමට ඇතුළත් කොටසට අදාළ පසුබිම ශුද්ධාත්ම දීමනාව කරණ කොටගෙන අපව නැවතත් දේව සබඳතාවයට පමුණුවනු ලැබීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේව අපට දැනටමත් දෙනු

ලැබ ඇත. මනුෂ්‍යයා පාපිෂ්ඨව, නුසුදුසුව සිටිය දී ම දෙවියන් වහන්සේ ඔහුට ආදරය කොට නැවතත් අපව දරුකමට ඇතුළත් කළ සේක.

## මෙනෙහි කිරීම

වසර දෙක තුනකට උඩ දී චතාරික කාලයේ දී මට වැරදීමක් සිදුවිය. ඒ අවුරුද්දේ චතාරික කාලය පුරාවට මගේ ප්‍රියතම ආහාර වර්ග කිහිපයකින් සම්පූර්ණයෙන් වැළකී සිටීමට අදිටන් කරගෙන සිටියෙමි. පළමු සති දෙක එතරම් අපහසුවකින් තොරව ගෙවී ගියේය. ප්‍රශ්නය පටන් ගත්තේ මා ඉතා ප්‍රිය කරන කේක් වර්ගයක් රැගෙන අමුත්තන් පිරිසක් නිවසට පැමිණීමත් සමගයි. එම වර්ගයේ කේක් සෑදීම පහසු නැත. මෙවැන්නක් ලැබෙන්නේ කලාතුරකිනි. පෙනුම ද ඉතා මනහර ය. චතාරික සමය අවසන් වන තෙක් එය කල්තබා ගැනීමට ද පුළුවන්කමක් නැත. රස නොබලා ඉන්නේ කොහොමද?



මම සිත තුළ පුංචි යුද්ධයක පැටළුණෙමි. **"කේක් කෑල්ලක් කෑවට පාපයක් සිද්ධ වෙන්නෙ නැනෙ. ජේසු තරහා වෙන එකක් නෑ. එක දවසක් විතරයිනෙ. හෙට ඉඳන් මම ආයෙත් මර්ධන ක්‍රියාව පටන් ගන්නවා. එකම එක කෑල්ලක්....!"** කේක් කෑල්ලක රස නොබැලුවොත් වෙන වැඩක යෙදීමට සිත එකඟ කරගැනීමටත් නොහැකි වන බවක් මට පෙනුණි. අවසානයේ පැය කිහිපයක සටනින් පසු මම කේක් කෑල්ලක රස බැලුවෙමි. ඇත්තට ම එය ඉතා රසවත් විය. මගේ රස නහර පිනා යන්නට විය. සිත සතුටින් පිරුණි.

එහෙත් මේ සියල්ල වැඩි වෙලාවක් පැවතුණේ නැත. තවත් කෑල්ලක් කෑමේ ආසාව මගේ සිත පෙළයි. මේ පෙළඹවීම කලින් තිබුණාට වඩා වැඩිය. අනෙක් අතින් මට මහා දුකක් දැනේ. "ඇයි මට ඒ පරිත්‍යාගය කරන්න බැරිවුණේ? මේ වගේ සුළු පරීක්ෂාවකට මුහුණ දෙන්නවත් මට ශක්තියක් නැද්ද?" මම පාපයක් කළා යැයි නොසිතමි. එහෙත් කේක් කෑල්ල නොකා සිටිය දී දැනුණු අපහසුවට වඩා බොහෝ විශාල අපහසුවක්, දුකක් දැන් මට දැනේ.

ඔබටත් මෙවැනි අත්දැකීම් තිබෙන්නට පුළුවන. මේ අත්දැකීම් අපට උගන්වන්නේ කුමක්ද? කෑමෙන් බීමෙන් සංසිඳවා ගත නොහැකි අවශ්‍යතාවයක් අප තුළ තිබෙන බව නොවේද? මහන්සි වී වැඩ කිරීමට, මහා පරිමාණ අනාගත සැලසුම් ඇඳීමට, ඉතුරුම් රැස් කිරීමට, මිතුරු මිතුරියන් සොයා යෑමට අපව පොළඹවන්නේ මේ නොසංසිඳෙන ආශාවයි. පිපාසය යි. කෑමෙන්, බීමෙන්, ඇඳුම් පැළඳුම් වලින්, ගෙවල් දොරවල් තුළින්, සුඛෝපභෝගී භාණ්ඩ වලින්, මිනිසුන් අතර පිළිගැනීම ලැබීමෙන්, ආදරය ලැබීමෙන්, අනුකම්පාව ලැබීමෙන්..... අප තෘප්තිමත් කරගන්නට උත්සහ කරන්නේ මේ පිපාසය යි.

නමුත් **මේ දේවල් කොපමණ ලැබුණත් අප සෑහීමකට පත් නොවන බව අපේ ම අත්දැකීම් වලින් දනිමු. එසේ නම් අපේ පිපාසය සංසිඳවා ගන්නේ කෙසේද?** අද පළමු කියවීම සහ සුවිශේෂය, පිපාසය සහ ජලය ගැන කතා කරයි. පළමු කියවීමේ ඊශ්‍රායෙල් ජනතාව කාන්තාරය මැද පිපාස වී සිටියහ. ඔවුන්ගේ පිපාසය කෙතරම් ද යත් මෝසෙස්ට ගල් ගසන්නට පෙළඹෙන තත්වයක් ඇතිවෙමින් තිබුණි. මෙහි දී දෙවියන් වහන්සේ ඔවුන්ව ජලය ඇති ස්ථානයක් වෙත යොමුකරනවා වෙනුවට පර්වතයක් ඉදිරියට රැගෙන යන සේක. ගලකින් ජලය ලබා ගත හැකිද? ඊශ්‍රායෙල්වරුන් මොනවා හිතන්නට ඇත්ද? තවත් කෝපවන්නට ඇති. එහෙත් මෝසෙස් දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස කළේය. සිදුවිය නොහැකි දේ දෙවියන් වහන්සේ කළ සේක. පර්වතයෙන් ජලය ගලා ආවේය.

අපේ ප්‍රශ්න වලට විසඳුම් ලබා ගැනීමේ මහා පිපාසයක් සෑම කෙනෙකුට ම ඇත. අපි යාච්ඤා කරමු. සමහර විට කොඳුරමු. ඒත් පිළිතුරක් නැත්නම් තරහා ඇති වේ. කලකිරීමට පත්වේ. පිළිතුරක් වෙනුවට දෙවියන් වහන්සේ අපව පර්වතයක් හමුවට පමුණුවන සේක. තව දුරටත් යාච්ඤා කිරීමෙන් පලක් නැතැයි දැන් අපට සිතෙයි. අපි විශ්වාසය අත්හැර දමමු. අපේ ම ක්‍රම වලින් විසඳුම් සෙවීමට උත්සහ කරමු. පර්වතයේ හැපි හැපි ලතවෙමු. එහෙත් අපි දෙවියන් වහන්සේ

කෙරෙහි විශ්වාසය තබා උන්වහන්සේට ඉඩ දෙන්නෙමු නම් බාධාවක් ලෙස පෙනෙන පර්වතයෙන් වුවත් විසඳුම් ලබා දීමට උන්වහන්සේට බලය ඇත.

මෝසෙස් ලබා දෙන්නේ ශාරීරික පිපාසය නිවීමට උපකාරී වන ජලය ය. සුවිශේෂයේ ක්‍රිස්තුන් වහන්සේ 'ජීවන ජලය' ගැන කතා කරන සේක. **උන්වහන්සේ අපට දෙන ජීවන ජලය නම් කුමක්ද? ඒ නම් ශුද්ධාත්මයාණන් වහන්සේ යි. අප තුළ නොනිවී දැල්වෙන පිපාසය සංසිඳවිය හැක්කේ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණකි.** "ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරෙන්න" මේ සතියේ අපට ලැබෙන ආරාධනාව එයයි. මිනිසුන්ගේ ආදරය සොයමින්, ගෞරවය, කීර්තිය සොයමින්, දේපල වල සුරක්ෂිත බව ලබමින් ජීවත් වූ කාලය ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළට පැමිණි විට අවසන් වී යයි. ආදරය සොයමින් දුක් වෙනවා වෙනුවට, අකමැති ම පුද්ගලයාටත් ආදරය කිරීමේ බලය අපට ලැබේ. කෑමෙන් බීමෙන් තෘප්තිමත් වෙනවා වෙනුවට තව කෙනෙක් වෙනුවෙන් එක්වරුශීල රැකීමේ තෘප්තිය අපට ලැබේ. බැංකු ගිණුමේ ඉතුරුම් ශේෂය බලා ලබන සතුට වෙනුවට සම්පූර්ණයෙන් ම දෙවි පියාණන් වහන්සේ මත පමණක් යැපීමේ සතුට අපට ලැබේ.



**ජීවන ජලය ලබා ගන්නේ කෙසේද? ඒ සඳහා මහා වෙහෙසක් දැරිය යුතු නැත. අප කළ යුත්තේ දෙවියන් වහන්සේට ඉඩ දීම පමණි.** බලන්න, මුලින් ම ජලය ඉල්ලා සිටින්නේ කාන්තාව නොවේ. ඇයගෙන් ජලය ඉල්ලන්නේ ක්‍රිස්තුන් වහන්සේ යි. උන්වහන්සේටත් පිපාසයක් ඇත. එනම් උන්වහන්සේ ගේ ජීවන ජලය අපට ලබා දීමට ඇති පිපාසයයි. අවශ්‍ය වන්නේ අප උන්වහන්සේ කෙරෙහි විශ්වාස කර උන්වහන්සේට ඉඩ දීමයි.

සමරිතානු ස්ත්‍රියට ගැළවීම ලබා දීමට ක්‍රිස්තුන් වහන්සේ කොපමණ බාධාක බිඳ දමන සේක් ද? නාඳුනන ස්ත්‍රියක් සමග කතා කිරීම ම ප්‍රශ්නයකට මුල පිරිමකි. ගෝලයින්ගේ ප්‍රතිචාරයෙන් මේ බව පැහැදිලිය. ජුදෙව්වන් විසින් පිළිකුල් කොට සැළකූ සමරිතානු ජාතිකයෙකු සමග කතා කිරීම තවත් වරදකි. එපමණක් නොව ඇය යහපත් කල්ක්‍රියාවක් නොතිබූ කාන්තාවක් බව ද පෙනේ. ඇය විවාහ නොවී පුරුෂයන් පස් දෙනෙකු සමග ජීවත් වී ඇත. අද කාලයේ හැටියට වුවත් මෙය සමාජයේ අවමානයට ලක් වීමට හේතුවකි. ජේසුන් වහන්සේ සොයා යන්නේ එවැනි කාන්තාවකි. මෙය අපට මහා සුභාරංචියකි. එදා ඒ කාන්තාවගේ ඇස් ඇරවීමට ජේසුන් වහන්සේ එතරම් අවදානමක් ගෙන ක්‍රියා කළ සේක් නම් අද දවසේ දී ඔබටත් මටත් ශුද්ධාත්මයාණන් ලබා දීමට උන්වහන්සේ කොපමණ ආශාවකින් සිටිනවා ඇත්ද? ප්‍රමාදය ඇත්තේ අපේ අතේ ය.

අද දෙවන කියවීමෙන් පාවුලු තුමා මේ අදහස තවදුරටත් ඉදිරියට රැගෙන යයි: "අප උදෙසා ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යාක්ෂ වන්නේ අප පව්කාරයින්ව සිටියදී ම ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි." යහපත් පුද්ගලයෙක් වෙනුවෙන් වුවත් ජීවිතය පූජා කිරීමට කිසිවෙක් ඉදිරිපත් වන්නේ කලාතුරකිනි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් දුක් වින්දේ අපේ පව්කාරකම දැන දැනම ය. එහෙයින් උන්වහන්සේගේ ආදරය ගැන සැක සංකා තබාගැනීමට හේතුවක් නැත.

ක්‍රිස්තුන් වහන්සේ අපව සොයා එන්නේ අප පමණක් සඳහා ම නොවේ. අප හරහා තවත් පිරිසක් උන්වහන්සේ වෙතට කැඳවා ගැනීම සඳහායි. ජේසුන් වහන්සේ සමග කතා බහ කිරීමෙන් පසුව සමරිතානු ස්ත්‍රිය තුළ ඇතිවන වෙනස බලන්න. ඇය නොදැනුවත්ව ම ධර්මදූතිකාවක් බවට පත්වන්නීය. ඇයගේ කීම අසා තවත් සමරිතානුවරු බොහෝමයක් උන්වහන්සේව සොයා ආවෝය. අපත් උන්වහන්සේ සමග කතා බහ කිරීමට උනන්දු වන්නේ නම් මෙවන් වෙනසක් අපටත් නොදැනීම අප තුළ ඇති වන්නේය. ඒ වෙනස නිසා අප අවට සිටින අයද උන්වහන්සේ වෙතට ඇදී එති. ඇත්තෙන් ම එය උන්වහන්සේගෙන් අපට ලැබෙන ජීවන ජලය, එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් සිදු කරන ක්‍රියාවකි. අප ක්‍රිස්තුන් වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇති කර නොගෙන, උන්වහන්සේ සමග කතා බහ කිරීමට කාලයක් වෙන්කර නොගෙන අනිත් අයට බණ දේශනා කිරීමෙන් නම් කිසිදු ඵලක් අත් නොවේ.

මේ චතාරික කාලය අපේ නුසුදුසුබව අමතක කොට අපව සොයා එන දෙවියන් වහන්සේගේ උණුසුම් ආදරය පිළිබඳව මෙනෙහි කිරීමට හොඳ ම කාලයයි. **තවමත් ඔබ දිනපතා ශුද්ධ ලියවිලි කියවා මෙනෙහි කිරීමට පටන් ගත්තේ නැත්නම් අද ම පටන් ගන්න. ඔබට කතා කිරීමට දෙවියන් වහන්සේට අවස්ථාවක් නොදුන්නොත් උන්වහන්සේගේ වචනය ඔබට ඇසෙන්නේ කොහොමද?** උන්වහන්සේගේ කැමැත්ත ඔබ දැන ගන්නේ කොහොමද? ආශාවන් සංසිඳවා ගැනීමට ඔබ සාමාන්‍යයෙන් කරන දේවල් වලින් මදක් ඈත් වෙන්න. ආහාර පාන මත යැපෙන ප්‍රමාණය අඩු කරන්න. රූපවාහිනියෙන් ලබන සතුට සීමා කරන්න. උත්සව, ප්‍රිය සාද වලින් හැකි තරම් ඈත් වන්න. සංගීතයෙන් ලබන සතුට අත් හරින්න. අවුරුද්ද පුරා ඔබ මේ දේවල් කළත් තවමත් තෘප්තිමත් වී නැති බව ඔබ දනියි. එහෙයින් දැන් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් ගෙන එන තෘප්තිය ලබා ගැනීමට මේ කාලයේ දී උත්සහ කරන්න. අඩුම තරමින් සතියකට වරක්වත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ කාලය ගත කරන්න. සමරිතානුවරුන් තමන් සමග නතර වන්න යැයි ජේසුන් වහන්සේගෙන් ඉල්ලූ විට උන්වහන්සේ ඔවුන් සමග නතර වූ සේක. මොනතරම් නිර්භීත, ඊටත් වඩා ආදරබර තීරණයක් ද? ඔබත් සමග නතර වන්නැයි අද දවසේ දී උන්වහන්සේගෙන් ඉල්ලුවොත් උන්වහන්සේ නතර නොවී සිටීවිද?

***“සමිඳුනී, මම පිපාස වෙමි. ඔබවහන්සේව දැක ගන්නට, ඔබවහන්සේගේ හඬ අසන්නට, ඔබවහන්සේගේ ආදරයට තුරුළු වන්නට පිපාසයක් මට ඇත. සමරිතානු ස්ත්‍රීයට මෙන් මට ද ජීවන ජලය පොවා මගේ පිපාසය සංසිඳුව මැනවි.”***

*irudinasupuwatha@gmail.com*